දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
...யலாளர்
...retary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/5/1/13/1/2011

ඔබේ අංකය
உமது இல.
Your No.
07/B/01/01/06/2021

දිනය
திகதி
Date
2022.10. 21

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10.

අධ්‍යක්ෂ
28 OCT 2022
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10.

SECRETARY
DDG(A)I
27 OCT 2022
1379169
MINISTRY OF HEALTH

27 OCT 2022

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී ඛණ්ඩ - 2 සේවා ගණය (MN-5-2006 ඒ) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2021.11.08 දිනැති ලිපිය හා බැඳේ.

02. යොමුගත ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 2012.07.27 දින මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ - 2 සේවා ගණය (MN-5-2006 ඒ) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙහි ඇමුණුම 1 හි සඳහන් (පිටු 02කින් සමන්විත) සංශෝධනයන් ඇතුළත් කිරීමට 2022.10.18 දින අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධන ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ඩී.ඩබ්ලිව්. ගයාන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -

I. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
II. ආයතන අධ්‍යක්ෂ ජනරාල්

- කරු. දැ.ගැ.ස.

**ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි ඛණ්ඩ 2 සේවා ගණය (MN-5-2006(ඒ) සඳහා වන**
**බඳවා ගැනීමේ පටිපාටිය**
**සංශෝධන ලැයිස්තුව -07**

<table>
<tr><th>අනු අංකය</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th></tr>
<tr><td>1.</td><td>7.1</td><td>
බඳවා ගන්නා අනුපාතය
<table>
<tr><td>අනු අංකය</td><td>අනුමත තනතුර</td><td>ධාරාව</td><td>ප්‍රතිශතය</td></tr>
<tr><td>04</td><td>වෛද්‍ය ලේඛන නිලධාරි</td><td>විවෘත</td><td>70%</td></tr>
<tr><td></td><td></td><td>සීමිත</td><td>30%</td></tr>
<tr><td></td><td></td><td>කුසලතා</td><td>.</td></tr>
</table>
සටහන : හෘද පෙනහළු නිවේශක, මනෝ වෛද්‍ය සමාජ සේවක, පෝෂණවේදී හා වෛද්‍ය ලේඛන නිලධාරී යන තනතුරු සඳහා ඉහත වගුවේ දක්වා ඇති ප්‍රතිශතවලට අනුව බඳවා ගැනීම් සිදු කරන අතර ඒ සඳහා පවත්වනු ලබන ලිඛිත විභාග සම්බන්ධ තොරතුරු ඇමුණුම 02a හා ඇමුණුම 02b අඩංගු වේ.
</td></tr>
<tr><td>2.</td><td>7.3</td><td>
7.3.2.1
<table>
<tr><td>අනු අංකය</td><td>තනතුර</td><td>සුදුසුකම්</td></tr>
<tr><td>04</td><td>වෛද්‍ය ලේඛන නිලධාරි</td><td>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම සහ පරිගණක විද්‍යාව පිළිබඳව වසර 01කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම</td></tr>
</table>
වෛද්‍ය ලේඛන කාර්යයන්වල වසර 05 හෝ ඊට වඩා වැඩි සේවා පළපුරුද්දක් ලබා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි සඳහන් MN 04 වැටුප් කේතයක් හිමි ස්ථිර තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ ඇති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක සේවය කරන නිලධාරියකුට සීමිත බඳවා ගැනීම යටතේ අයදුම් කළ හැකිය.<br><br>
<u>සටහන</u><br>
සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ ඉහත අනෙකුත් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට ද සීමිත බඳවා ගැනීම යටතේ අයදුම් කළ හැකිය.<br><br>
7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් මගින්<br>
7.3.3.1 ලිඛිත විභාගය
<table>
<tr><td>අනු අංකය</td><td>තනතුර</td><td>විෂයයන්</td><td>උපරිම ලකුණු ප්‍රමාණය</td><td>සමත් ලකුණු ප්‍රමාණය</td></tr>
<tr><td>04</td><td>වෛද්‍ය ලේඛන නිලධාරි</td><td>විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය</td><td>100</td><td>40%</td></tr>
</table>
</td></tr>
</table>

<table>
<tr>
<td>3</td>
<td>ඇමුණුම<br>02 b</td>
<td>
සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 02 සේවා ගණයේ (MN-5-2006 ඒ) සඳහා අදාළ තනතුරුවලබඳවා ගැනීම්පටිපාටිය<br><br>
01. විභාගයේ නම : තනතුරුවලට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගය<br>
02. විභාගය පිළිබඳ විස්තර
<table>
<tr><th>අනු අංකය</th><th>තනතුර</th><th>ප්‍රශ්න පත්‍රය</th><th>කාලය</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>01</td><td>හෘද පෙනහළු නිවේශක</td><td>1.බුද්ධි පරීක්ෂණය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
<tr><td>02</td><td>වෛද්‍ය ලේඛන නිලධාරි</td><td>2.විෂයානුබද්ධ පරීක්ෂණය</td><td>පැය 02</td><td>100</td><td>40%</td></tr>
<tr><td>03</td><td>මනෝ වෛද්‍ය සමාජ සේවක</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>04</td><td>පෝෂණවේදී</td><td></td><td></td><td></td><td></td></tr>
</table>
<br>
ඒ අනුව අංක 05 යටතේ දැක්වෙන විභාගය සඳහා වන විෂය නිර්දේශය දැක්වෙන වගුවේ අංක 03 හි දැක්වෙන පොදු ප්‍රශ්න පත්‍රය තීරුව ඉවත් වේ.
</td>
</tr>
</table>